


SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY

P.O.BOX 2211 AUTHUR DE SILVA MAWATHA

COLOMBO 13

Designed by : Susantha Wickramasuriya
(Sugathadasa Stadium)

SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY ANNUAL REPORT - 2011

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## சுகததாச தேசிய விளையாட்டுப் பல்தொகுதி அதிகாரசபை

## SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY



# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

ANNUAL REPORT

2011

Incorporated by the act of Parliament No.17 of 1999

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

පටුන

තොරතුරු සම්බන්ධීකරණය 2
ක්‍රීඩාංගණ පාලක කළමනාකාරීත්වය 3
අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර 4
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම 5
අනුමත කාර්යය මණ්ඩලය 6
මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන් 7
පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර 8
සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය 9
ගෘහස්ථ ක්‍රීඩාගාරය 9
උප ක්‍රීඩාගාර 10
පිහිණුම් තටාක සංකීර්ණය 11
කායවර්ධන මධ්‍යස්ථානය 12
ක්‍රීඩා හෝටලය 12
සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණය 13
ආර් ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය 14
බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය 15
බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක 16
නුවරඑළිය තුරග තරඟ පිටිය 17
ආයතනයේ සමස්ථ ප්‍රගතිය 18
ගිණුම්කරණ ප්‍රතිපත්ති 19
ආදායම් වියදම් ප්‍රකාශය 24
ශේෂ පත්‍රය 24
අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය 26
විගණකාධිපති වාර්තාව 27

## තොරතුරු සම්බන්ධීකරණය

**ආයතනයේ නම**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

<u>සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය</u>

<u>ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන්</u>

1999 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින්

නීතිගත කර ඇත.

### කළමනාකාරීත්ව මණ්ඩලය

(2011 ජනවාරි සිට ජූලි දක්වා)

රොනී ඊබ්‍රහීම් මහතා - සභාපති

එස් එස් එන් ද සිල්වා මහතා - සාමාජික

නවීන් පෙරේරා මහතා - සාමාජික

එම් චමල් පෙරේරා මහතා - සාමාජික

පී හතරසිංහ මහතා - සාමාජික

වින්ග් කමාන්ඩර් බී ඩී අබේසූරිය මහතා - සාමාජික

ඒඑස්පී පී නිසල් රත්නායක මහතා - සාමාජික

බ්‍රිගේඩියර් පී ඩබ් පී සමරතුංග මහතා,ආර්එස්පී,යූඑසපී,ඒටීඕ -සාමාජික

මනු චන්මුගම් මහතා - සාමාජික

පන්ඩුක කීර්තිනන්ද මහතා - සාමාජික

ගයනි සී විතාන මහත්මිය - ලේකම්

### ලිපිනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

තැ.පෙ 2211, ආනර් ද සිල්වා මාවත,

කොළඹ 13.

දුරකථන : 011-2445677. 2422841
011-2384490. 2384385

ෆැක්ස් : 011-2445675

විද්‍යුත් තැපැල්- sugathad@sltnet.lk

### කළමනාකාරිත්ව මණ්ඩලය

(2011 අගෝස්තු )

නිමල් මිත්‍රරත්න මහතා - සභාපති

එම් පි ඩී යු කේ මාපා පතිරණ මහතා - සාමාජික

මනුල චමල් පෙරේරා මහතා - සාමාජික

එම් ඩි රංජනී ජයකොඩි මිය - සාමාජික

වින්ග් කමාන්ඩර් බී ඩී අබේසූරිය මහතා - සාමාජික

ඒඑස්පී පී නිසල් රත්නායක මහතා - සාමාජික

බ්‍රිගේඩියර් පී ඩබ් පී සමරතුංග මහතා,ආර්එස්පී,යූඑසපී,ඒටීඕ - සාමාජික

මනු චන්මුගම් මහතා - සාමාජික

පණ්ඩුක කීර්තිනන්ද මහතා - සාමාජික

එච් එම් එම් එස් බංඩාර හේරත් මහතා - සාමාජික

ගයනි සී විතාන මහත්මිය - ලේකම්

### කළමනාකාරිත්ව මණ්ඩලය

(2011 සැප්තැම්බර් සිට)

බ්‍රිගේඩියර් පී ඩබ් පී සමරතුංග මහතා,ආර්එස්පී,යූඑසපී,ඒටීඕ - සභාපති

නිමල් මිත්‍රරත්න මහතා - සාමාජික

එම් පි ඩී යු කේ මාපා පතිරණ මහතා - සාමාජික

එම් ඩි රංජනී ජයකොඩි මිය - සාමාජික

මනුල චමල් පෙරේරා මහතා - සාමාජික

වින්ග් කමාන්ඩර් බී ඩී අබේසූරිය මහතා - සාමාජික

ඒඑස්පී පී නිසල් රත්නායක මහතා - සාමාජික

මනු චන්මුගම් මහතා - සාමාජික

පණ්ඩුක කීර්තිනන්ද මහතා - සාමාජික

එච් එම් එම් එස් බංඩාර හේරත් මහතා - සාමාජික

චන්ද්‍රසේන හේවා අතපත්තු මහතා - ලේකම්

### විගණනය

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

අංක 306/72 පොල්දූව පාර,

බත්තරමුල්ල.

## ක්‍රීඩාංගන පාලක කළමනාකාරීත්වය

| | |
|---|---|
| බ්‍රිගේඩියර් ජී ඩබ් ජී සමරතුංග මහතා,ආර්එස්පී,යූඑසපී,ඒටීඕ | - සභාපති |
| ලුතිනන් කර්නල් එල් එච් එම් රාජපක්ෂ,ආර්එස්පී | - අධ්‍යක්ෂ |
| එච් එම් නිල්මිණී කේ හේරත් මිය | - සහකාර අධ්‍යක්ෂ |
| ඒ එන් සමරසිංහ මහතා | - සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) |
| චමින්ද කේ උඩකුඹුර මහතා | - සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| ජී සී ජානකී මිය | - අභ්‍යන්තර විගණක |
| එන් සී ජේ අතුකෝරල මිය | - කළමනාකාරිනී (නඩත්තු) |
| කේ බන්දුතිලක මහතා | - කළමනාකරු (පාලන / තොරතුරු තාක්ෂණ) |
| පී ඩී එන් ප්‍රභා කිරිඇල්ල මිය | - කළමනාකරු (ගෘහස්ථ) |
| ජී ඩී සම්පත් පෙරේරා මහතා | - කළමනාකරු (එළිමහන් ) |
| නෙරංජලා පී මොරගොඩ මෙය | - කළමනාකරු (අලෙවි) |
| කේ පී ජී නිල්මිණී කිරිඇල්ල මිය | - කළමනාකරු (මිලදිගැනීම්) |
| ඩී සී වසන්ත අමරසේකර මහතා | - කළමනාකරු (ගිණුම්) |
| එච් ඒ රොෂාන් කුමාර මහතා | - කළමනාකරු (බෝගම්බර) |
| මේජර් එච් ජී උපාලි මහතා | - කළමනාකරු (ආරක්ෂක) |

## විගණන හා කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| එම් පී ඩී යු කේ මාපා පතිරණ මහතා | - සභාපති |
| මනු චන්මුගම් මහතා | - සාමාජික |
| බී ඩී අබේසූරිය මහතා | - සාමාජික |
| ඊ ඒ පී ආනන්ද මහතා | - සාමාජික |
| එස් පී විජේරත්න මහතා | - සාමාජික |
| කේ පී ජී ප්‍රනාන්දු මිය | - සාමාජික |
| ජී සී ජානකී මිය | - ලේකම් |

## බැංකුව

ලංකා බැංකුව,

ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

## අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර




ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබාදීම.




ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායක වීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට ඇවසි පහසුකම් සහිත ආසියානු කලාපයේ ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ප්‍රමුඛතම ක්‍රීඩා සංකීර්ණයක් බවට පත්වීම.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995-02-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනත 1999-09-01 දින සිට බලපාන සේ සම්මතවූ අතර, එදින සිට මෙම ජාතික ක්‍රීඩා සංකීර්ණය "සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය" ලෙස ස්ථාපිත කරන ලදී.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මගින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. සභාපති- ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරණු ලැබේ
2. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු
3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලබන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්
4. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු
5. මීට අමතරව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් 07 දෙනෙකු .

## අනුමත කාර්යය මණ්ඩලය

ඉහත සඳහන් කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ බඳවාගැනීමේ පරිපාටියේ පරිදි අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව 328ක් වේ. 2011-12-31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සංඛ්‍යාව 79% ක් වේ. එය පහත සඳහන් පරිදි සවිස්තරාත්මකව දැක්විය හැක.

| අංක | තනතුර | 2011-12-31 දිනට සේවක සංඛ්‍යාව | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ | 01 | 01 |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | - | 01 |
| 03 | සහකාර අධ්‍යක්ෂ | 02 | 04 |
| | ආශ්‍රිත නිළධාරීන් | | |
| 04 | අභ්‍යන්තර විගණක | 01 | 01 |
| 05 | තොරතුරු තාක්ෂණ නිළධාරී | 01 | 01 |
| 06 | නඩත්තු නිළධාරී | 01 | 01 |
| 07 | මිලදීගැනීම් නිළධාරී | 01 | 01 |
| 08 | අලෙවි නිළධාරී | 01 | 01 |
| 09 | ස්ථානභාර නිළධාරී | 05 | 05 |
| | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | |
| 10 | කාර්මික සහකාර | - | 02 |
| | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | | |
| 11 | කළමනාකරණ සහකාර | 26 | 35 |
| 12 | පිට්ටනි සැලසුම්කරු | 01 | 01 |
| 13 | වැඩ පරීක්ෂක | 01 | 02 |
| 14 | ක්‍රීඩා නිළධාරී /ක්‍රීඩා පුහුණුකරු | 04 | 09 |
| 15 | ප්‍රධාන ආරක්ෂක නිළධාරී /ආරක්ෂක නිළධාරී | 14 | 20 |
| | ප්‍රාථමික ශිල්පීය | | |
| 16 | රියදුරු | 07 | 06 |
| | ප්‍රාථමික අර්ධ ශිල්පීය | | |
| 17 | වඩු කාර්මික පෙදරේරු, පයිප්ප වෑද්දුම්කරු, පින්තාරුකරු | 09 | 15 |
| 18 | විදුලිකාර්මික | 01 | - |
| 19 | පනිවිඩකරු | 01 | 02 |
| | ප්‍රාථමික අර්ධ ශිල්පීය නොවන | | |
| 20 | ක්‍රීඩාංගණ සහායක | 97 | 110 |
| 21 | කාර්යාල කාර්යය සහයක | 02 | 10 |
| 22 | ආරක්ෂක නියාමක (පිරිමි/ගැහැණු) | 92 | 100 |
| | මුළු එකතුව | 268 | 328 |

## මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන්

### වගකීම්

1. කලමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස එය ආරක්‍ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
2. සියළු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.
3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩි දියුණුකිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරිම.
4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කර ගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩි දියුණු කර ගැනීමට හැකිවනසේ, මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.
5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වාගෙන යාම.
6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.
7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාංශ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධාන හා ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.
8. අප අධිකාරියේ පහසුකම් කලමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට හා සාධාරණ ගාස්තුන්ට යටත්ව පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

### කාර්යයන්

ඉහත වගකීම් ඉටු කරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කල සහනදායී ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

1. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රිඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
2. ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
3. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්‍ෂ ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මගින් ඔවුන්ගේ දක්‍ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට එමට අවශ්‍ය පහසුකම් සැපයීම
4. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිණුම් හා කිමිදුම් තටාකාංගන පහසුකම් සැපයීම.
5. විහාග,සම්මන්ත්‍රණ,සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
6. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම

## පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂී හැකියාවත් සතු සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දයකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

### ක්‍රීඩා

සියළු මලල ක්‍රීඩා, රගර්, දැල්පන්දු, පැසිපන්දු, අත්පන්දු, වොලිබෝල්, බැඩ්මින්ටන්, ස්කොෂ්, මේසපන්දු, මල්ලවපොර, ජුඩෝ, වුෂු, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික්, ක්‍රිකට්, යනාදී ක්‍රිඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

### සෞඛ්‍ය හා අධ්‍යාපන

ජාතික සහ ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, කායවර්ධන පාඨමාලා, පිහිණුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා ,සංදර්ශන , රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයිම

### විනෝදස්වාදය

(1) ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාන සංදර්ශන සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයිම

(2) වෙළඳ ප්‍රචාර හා දැන්වීම් අලෙවිකරණයට අදළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ විඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල සහසුකම් ලබාදීම මගින් සේවා සහ පහසුකම් සැපයීම අතිශයින් ජනප්‍රිය වෙළඳ දැන්වීම් මෙම අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළයුතුය

ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.

1. සුගතදස ගෘහස්ථ ක්‍රීඩාංගණය හා පිහිණුම්/කිමිදුම් තටාකාංගන
2. සුගතදස ක්‍රීඩා හෝටලය
3. සුගතදස එළිමහන් ක්‍රීඩාංගණය
4. ආර්. ප්‍රේමදස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
   ( 2006.11.01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදුදී ඇත)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක

## සුගතදස ගෘහස්ථ ක්‍රීඩාංගණය

සුගතදස ගෘහස්ථ ක්‍රීඩාංගණය පහත සඳහන් අංග වලින් සමන්විතවේ.

01. ගෘහස්ථ ක්‍රීඩාගාරය

02. උප ක්‍රීඩාගාර

03. පිහිනුම් තටාක සංකීර්ණය

04. කායවර්ධන මධ්‍යස්ථානය

05. ක්‍රීඩා හෝටලය

### ගෘහස්ථ ක්‍රීඩාගාරය




ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004 කින් සැදුම්ලත් වායු සමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයක් සහිත වන අතර. මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර 35 ක් හා දිග මීටර 40 ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජුඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාටේ, මල්ලවපොර, ටයික්වොන්ඩෝ, කබඩි, වුෂු ආදී ගෘහස්ථ ක්‍රීඩා තරග පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ.

මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා විවිධ වැඩමුළු සඳහාද පහසුකම් සපයනු ලැබේ.




සුමති ටෙලි සම්මාන උළෙල



බොක්සිං තරගයක්




ආශා බෝස්ලේ සංගීත සංදර්ශනය

2011 වර්ෂයේ ශෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවැති මුළු තරග /ශූරතාවල සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදිවේ.

- පිම්නාස්ටික් - 04
- වොලිබෝල් - 04
- බොක්සිං - 05
- කරාටේ - 11
- අත්පන්දු - 01
- සංගීත සංදර්ශන - 07
- විභාග - 02
- සම්මාන උළෙල - 03
- දැල්පන්දු - 02
- වුෂු තරග - 01
- සම්මේලන - 15
- වෙළඳ රූගතකිරීම් - 01
- වෙනත් - 23

## උප ක්‍රීඩාගාර







මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර ක්‍රීඩා තරග හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සැපයීමෙන් 2011 වර්ෂයේදී රු. 962,251/-ක ආදයමක් එමගින් උපදවා ඇත.

## පිහිණුම් තටාක සංකීර්ණය

ජාතිය සතු ජාත්‍යන්තර මට්ටමේ සියළු පහසුකම් සහිත පිහිණුම් තටාකාංගනය අප අධිකාරිය සතුව ඇති අතර, එය පිහිණුම් තටාක 04කින් යුක්ත වේ.

- ප්‍රධාන පිහිණුම් තටාකය (මීටර 50)
- පුහුණුවීම් සඳහාවු උප තටාකය (මීටර 25)
- කිමිදුම් තටාකය,
- කුඩා ළමුන් සඳහාවු තටාකය

මෙම තටාක අතරින් ප්‍රධාන පිහිණුම් තටාකය හා කිමිදුම් තටාකය ජල කාන්දුවීම් නිසාවෙන් වසර ආරම්භයේ සිට වසා තිබූ අතර, 2011 සැප්තැම්බර් 12 දින අළුත්වැඩියා කටයුතු සිදුකිරීම් ආරම්භ කරන ලදී. මෙම අළුත්වැඩියා කටයුතු 2012 ජූලි 07 වන දින නිම කිරීමට නියමිතව ඇත.



ප්‍රධාන පිහිණුම් තටාකය
(අළුත්වැඩියා කටයුතු සිදුකෙරෙමින් පවතින)



කිමිදුම් තටාකය
(අළුත්වැඩියා කටයුතු සිදුකෙරෙමින් පවතින)



කුඩා ළමුන් සඳහාවු තටාකය



පුහුණුවීම් සඳහාවු උප තටාකය

මෙම පිහිණුම් තටාකාංගන මගින් පාසැල් පිහිණුම් තරග පැවැත්විමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරග පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. ඒ සඳහා නවීන විද්‍යුත් කාලඝණක උපකරණ මගින් කාලය සටහන් කිරිමේ පහසුකම් සපයා ඇති අතර, දිවා/රාත්‍රී තරග සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සපයා ඇත. මීට අමතරව පාසැල් ළමුන් සඳහා පිහිණුම් පාසලක්ද පවත්වා ගෙන යන අතර, මෙමගින් ඉතාමත් අඩු මුදලකට පිහිණුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. මෙම වසර තුල ප්‍රධාන පිහිණුම් තටාකය සහ කිමිදුම් තටාකය ජල කාන්දුවීම් හේතුවෙන් හා අළුත්වැඩියා කටයුතු සිදුකල නිසාවෙන් පිහිණුම් තරග නොපවත්වන ලද අතර ළමා පිහිණුම් තටාකය හා පුහුණුවීම් සඳහාවු උප තටාකය පමණක් භාවිතාකරන ලදී. එමගින් මෙම වර්ෂයේදී රු.2,376,336/- ආදයමක් උපදවා ඇත

## කායවර්ධන මධ්‍යස්ථානය

සියළුම උපකරණ වලින් සමන්විත කායවර්ධන මධ්‍යස්ථානයක් තිබෙන අතර, ක්‍රීඩක/ක්‍රීඩිකාවන්ට මෙන්ම බාහිර පුද්ගලයින්හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක. තවද මෙම මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු 2012 දෙසැම්බර් 06 දින ආරම්භ කරන ලද අතර 2012 මාර්තු 20 දින නවීකරණ කටයුතු නිම කිරීමට නියමිතව ඇත. එමෙන්ම නවීන කායවර්ධන උපකරණ මිළදී ගැනීමටද ඉදිරි වර්ෂයේදී කටයුතු කරනු ඇත. 2011 වර්ෂයේ කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු. 1,054,986/- ආදායමක් උපදවා ඇත.





## ක්‍රීඩා හෝටලය

මෙම ක්‍රීඩා හෝටලය පහත අංගවලින් සමන්විත වේ

- තනි කාමර 06
- යුගල කාමර 14
- වායුසමනය කළ යුගල කාමර 04
- සමූහ කාමර 18
- රැස්වීම් ශාලා (ශ්‍රවණාගාර) 02

සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවතවාගෙන එනු ලබන මෙම ක්‍රීඩා හෝටලය කාමර 42 කින් සහ 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට රැස්විය හැකි ශ්‍රවණාගාර පහසුකම්ද, ක්‍රීඩකයන්ට නවාතැන් ගත හැකි සමූහ කාමර පහසුකම් වලින්ද සමන්විතවේ. මෙම හෝටලය කාමර පහසුකම් සැපයීමට අමතරව විවාහ මංගල උත්සව, රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම් සපයනු ලබයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට සහ ජාතික සංගම් සඳහා සහනදායී පදනම මත මෙම හෝටලයේ පහසුකම් ලබා දෙනු ලැබේ. ක්‍රීඩාංගණයේ අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි ඉඩ කඩ පවතින අවස්ථාවන් වලදී සාමාන්‍ය ජනතාව සඳහා පහසුකම් ලබා දීම සිදුකරයි. තවද මෙම වසරේදී ආහාරපාන සැපයීමක් සිදු නොකරන ලද හෙයින් මුළුතැන්ගෙය භාවිතා කර නැත. දැනට මෙහි නවාතැන් පහසුකම් පමණක් ලබාදෙයි.



2011 වර්ෂයේදී ගෘහස්ථ ක්‍රීඩාංගණයට අයත් ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන්, පිහිණුම් තටාකයෙන්, කායවර්ධන මධ්‍යස්ථානයෙන් සහ ක්‍රීඩා හෝටලයෙන් රු. 45,913,022/-ක ආදායමක් උපදවා ඇත.

## සුගතදස එළිමහන් ක්‍රීඩාංගණය



මීටර් 400 කෘත්‍රිම ධාවන පථය හා ක්‍රීඩා පිටිය



මීටර් 200 කෘත්‍රිම ධාවන පථය

මෙම ක්‍රීඩා පිටිය ජවන හා පිටිය ක්‍රීඩා තරග දිවා රාත්‍රී දෙකේම පැවැත්වීමට හැකි ආකාරයට සකසා ඇත. මෙම ක්‍රීඩාංගණයේ එකවර ප්‍රේක්ෂකයින් 30.000 කට ආසන්න ප්‍රමාණයකට තරග නැරඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත. ක්‍රීඩාංගණයේ මීටර 400 කෘත්‍රිම ධාවන පථයක් හා මීටර් 200 කෘත්‍රිම ධාවන පථයක්ද ඇත. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා අවශ්‍ය විද්‍යුත් කාලඝණක හා විද්‍යුත් මිනුම් යන්ත්‍ර පහසුකම්ද, මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලිධාරා පද්ධතියක් මගින් රාත්‍රී ක්‍රීඩා තරග පැවැත්වීමට අවශ්‍ය පහසුකම්ද සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මලල ක්‍රීඩා, වොලිබෝල්, අත්පන්දු, ඇමරිකානු පාපන්දු, රගර්, පාපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ

මෙම ක්‍රීඩාංගණයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2011 සැප්තැම්බර් මස සිට පාපන්දු පිටියද, 2011 දෙසැම්බර් මස සිට මීටර් 400 කෘත්‍රිම ධාවන පථය නැවත ඇතිරීම සඳහාද වසා තබන ලදී. 2012 අප්‍රේල් 20 දින වන විට මීටර් 400 කෘත්‍රිම ධාවන පථයද, 2012 ජුලි 19 දින වන විට පාපන්දු පිටියෙහිද වැඩ **නිම කිරීමට නියමිතව** ඇත.



**නවීකරණය වෙමින් පවතින**

මීටර් 400 කෘත්‍රිම ධාවන පථය හා ක්‍රීඩා පිටිය

### 2011 වර්ෂයේ මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග හා උත්සව පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

- පාපන්දු තරග - 20
- ක්‍රීඩා තරග (පාසල් නිවාසාන්තර තරග) - 80
- මලල ක්‍රීඩා තරග - 28
- රගර් තරග - 16
- වෙළඳ රූගතකිරීම් හා වෙළඳ කුටි - 09
- වෙනත් ක්‍රීඩා තරග - 01
- වෙනත් උත්සව - 02
- ක්‍රීඩා පුහුණුවීම් - 430

මෙම ක්‍රීඩාංගණයෙන් 2011 වර්ෂයේදී රු.15,894,462/- ආදායමක් උපදවා ඇත.

## ආර් ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය



ආර් ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියළු පහසුකම් වලින් සමන්විත එක් ක්‍රීඩාංගණයකි. මෙහි එකවර ප්‍රේක්ෂයින් 35,000 කට පමණ තරඟ නැරඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගණය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව 2006-11-01 දින සිට වසර 30(තිහ)ක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදුදී ඇත. ඒ අනුව 2011 වර්ෂයේ මෙම ක්‍රීඩාංගණය මගින් රු. 3,000,000/-ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායමක් ලෙස පැවති මෙම ක්‍රීඩාංගණය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදුකුළියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.

## බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගණය





මෙම ක්‍රීඩාංගණය මහනුවර නගර සභාව විසින් පාලනය කල අතර, 1999 සිට අප අධිකාරිය මගින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගණය තුල එකවර ප්‍රේක්ෂකයින් 10,000ක් පමණ තරග නැරඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මලල ක්‍රීඩා, පාපන්දු , රගර් , වොලිබෝල් ,දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම වසරේදී ක්‍රීඩාංගණයේ විදුලි පරිපථ පද්ධතිය නැවත ඇතිරීමට හා ශක්ති වර්ධන ශාලාවක් අලුතින් ඉදිකිරීම සඳහාද කටයුතු ආරම්භ කරන ලදී. මෙම ක්‍රීඩාංගණයෙන් 2011 වර්ෂයේදී රු 2,553,687/- ආදායමක් උපදවා ඇත.

### 2011 වර්ෂයේ මෙම ක්‍රීඩාංගණයේ පැවැත්වූ තරග හා උත්සව පිළිබඳ වාර්තාව පහත පරිදි වේ.

- මලල ක්‍රීඩා හා පාසල් ක්‍රීඩා තරග - 52
- පාපන්දු තරග - 52
- රගර් තරග - 33
- වෙළඳ රැගතකිරීම් - 01
- ක්‍රීඩා පුහුණුවීම් - 365

## බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක





බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලේ පිහිණුම් තටාක වල නඩත්තු හා පරිපාලන කටයුතු පමනක් අප අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලැබේ,
අවට ප්‍රදේශ වල වැඩිහිටියන් හා පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පිහිණුම් පුහුණු කටයුතු පවත්වාගෙන යනු ලබන අතර. මෙම පිහිණුම් තටාක වලින් 2011 වර්ෂයේදී රු.129,022/- ආදායමක් උපදවා ඇත.
තවද, මෙම පිහිණුම් තටාක වල භාවිතය ඉතා අවම මට්ටමක පැවති අතර ඒ සඳහා ක්‍රියාමාර්ගයක් වශයෙන් පිහිණුම් තටාක අවට පාසැල් ලමුන් සඳහා දින තුනක ගාස්තු රහිත පිහිණුම් වැඩමුළුවක් පැවැත්වූ අතර එමගින් සාමාජිකත්වය වැඩිවීමේ යම් ප්‍රවනතාවයක් දක්නට ඇත.

- බෙලිඅත්ත
  - I මංතීරු 08 ක් සහිත මීටර් 50 පිහිණුම් තටාකය
  - II කිමිදුම් තටාකය

- <u>වීරකැටිය</u>
  - I මංතීරු 08 ක් සහිත මීටර් 25 පිහිණුම් තටාකය

## නුවරඑළිය තුරඟ තරඟ පිටිය




මෙම තුරඟ තරඟ පිටියේ භාරකාරීත්වය 2011-07-05 දින සිට ක්‍රිඩා අමාත්‍යාංශය වෙත පවරා ගත් අතර, 2011 ඔක්තෝබර් මාසයේ සිට මෙම තුරඟ තරඟ පිටියේ කළමණාකාරීත්වය අප අධිකාරියට පවරා ඇත. මෙහි භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564 කි.

2011 ඔක්තෝබර් මාසයේ සිට මෙම ක්‍රීඩාංගනයේ අශ්ව ගාල් සඳහා මාසකට රු.100/- බැගින් අයකිරීමක් සිදු කරන ලදී. එමගින් ලද ආදයම රු. 29,937/= කි.




2012 වර්ෂය සඳහා මෙම ක්‍රීඩාංගනයේ විවිධ ආදයම් ප්‍රභවයන් යෝජනා කොට ඇති අතර, ස්ථාවර ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන කටයුතු යෝජනා කොට ඇත.

## ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2011 වර්ෂයේ අධිකාරියේ මුලධන වියදම රු.109,652,467/- ක් වු අතර, ක්‍ෂය හා පාරිතොෂික වෙන් කිරීම සමග මෙහෙයුම් වියදම රු.219,697,370/- කි. මින් රු.85,929,782/- ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා ක්‍ෂය වෙන්කිරීම් වේ.

2011 වර්ෂය සඳහා අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.291,189,602/- ක් හා පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස රු.74,600,000/- ක මුදක් ලබාගෙන ඇත. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව ලබාගත් පුනරාවර්තන ප්‍රතිපාදන මුදල රු.4,900,000/-කින් වැඩිවී ඇත.

2011 වර්ෂයේ අධිකාරිය විසින් උපයා ඇති ආදායම රු.69,006,960/- ක් වන අතර එය 2010 වර්ෂයට වඩා රු.7,397,134/- ක වැඩිවීමකි. 2010 වර්ෂයේ වියදම 2009 වර්ෂයට වඩා වැඩිවීමට ක්‍ෂය වෙන්කිරීම් රුපියල් 25,144,988 කින් වැඩිවීම ප්‍රධාන ලෙස බලපා ඇත.

2011 වර්ෂයේ ආයතනය විසින් උපයා ඇති ආදායම රු.69,006,960/- ක් වු අතර ක්‍ෂය වෙන්කිරීම සමග මුළු වියදම (මූල්‍ය වියදම් සමග) රු.219,945,446/- ක් විය.

2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදායම පහත පරිදි විචලනය වී ඇත.

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| ආදායම රු. මිලියන | 53.32 | 67.32 | 60.65 | 54.78 | 57.85 | 61.60 | 69.00 |




## ආයතනයේ මුළු ණය

2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා තිබු ණය තත්වය පහත ආකාරයට අඩු වැඩි වී ඇත.

| වර්ෂය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|
| ණය රු. මිලියන | 0.80 | 0.10 | 1.50 | 2.30 | 4.61 | 133.03 | 42.95 |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. සාමාන්‍ය

1.1 අනුකූල වීමේ ප්‍රකාශය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

1.2 පිළියෙල කිරීමේ පදනම

මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහාවූ ගැලපිලිකිරීම් ගිණුම් වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්වයන් සැලකිල්ලට ගෙන නොමැත

1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මුල්‍ය වාර්ථාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම් වල හෙළිදරව් කර ඇත.

02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම් වලින් ජංගම වත්කම් ලෙස හඳුනා ගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුලදී වසරක් තුල මුදල් බවට පරිවර්ථනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

2.1 වත්කම්

දේපල, පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම් වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම් වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංශවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගැනු කාලය සලකා බලාය.

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයයෙන් මසකට රු.250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු.25,023,264/- මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරගනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තඨාක සංකීර්ණය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලට අයත්ව තිබූ පිහිණුම් තටාක දෙකත් සහ කිමිදුම් තටාකය 2008 වර්ෂයේ සිට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනාකරණ අනුමැතිය මත සේවකයින් නම(09) දෙනෙක් තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත. එයින් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත වේ

2008 වසරේ මෙම පිහිණුම් තටාක වල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙස ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තීරන මත 2009 වසරේ සිට මෙම පිහිණුම් තටාක වල වියදම් වෙනම ගිණුම් වල දැක්වේ.

නුවරඑළිය තුරඟ තරඟ පිටිය

මෙම තුරඟ තරඟ පිටියේ භාරකාරීත්වය 2011-07-05 දින සිට ක්‍රීඩා අමාත්‍යාංශය වෙත පවරා ගත් අතර, 2011 ඔක්තෝබර් මාසයේ 23 දින සිට මෙම තුරඟ තරඟ පිටියේ කළමණාකාරීත්වය අප අධිකාරියට පවරා ඇත

2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරීම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර එවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම් ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනිත කර ඇත්තේ එම වියදම් මඟින් වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියළුම වියදම් ආදායම් ප්‍රකාශනයට ගලපා ඇත.

2.3 ක්ෂයවීම්

ක්ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ගක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම් වල ක්ෂය වීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්ණ කල වසරේ සිටය. ක්ෂය අපේක්ෂිත ආයුකාලය තුල ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදු කර නොමැත.

- ගොඩනැගිලි සහ ඉදිකිරීම් 2.5%
- අධිබලැති විදුලි කුලුණු 10%
- කෘතිම ධාවන පථය 20%
- යන්ත්‍ර හා උපකරණ 10%
- පරිගණක 25%
- මෝටර් රථ 20%
- ක්‍රීඩා උපකරණ 10%
- ලී බඩු හා උපකරණ 10%
- කාර්යාලීය උපකරණ 10%
- තිර රෙදි 50%
- අධිබලැති විදුලි බල්බ සහ ජ්වලකය(ඉග්නයිටර්) 50%

32-5811 දරණ පැජරෝ රථය මිනිස්බල හා යෙදවුම් අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේක 150ට අනුව මහාභාණ්ඩාගාරයෙන් රු.9,100,000ක් වටිනා NB-1527 නව වැන්රථය ලබාදී ඇත. වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම් ගතකර ඇත.

2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනීම්

වෙළඳ හා අනෙකුත් ණය ගැනීම් මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

2.5 තොග

තොග මූල්‍ය වාර්ථාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම් වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තීරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්ථමාන තත්වය හා අදල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම් වලට අදල වේ.

## 03 වෙන්කිරීම් හා වගකීම්

මූල්‍ය වාර්ථා පිළියෙල කිරීමේ දී හඳුනාගන්නා ලද සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත. මූල්‍ය වර්ථා වල ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය.

3.1 සේවක හිමිකම්

සේ. අර්ථසාධක අරමුදල හා සේ. භාරකාර අරමුදලට කරන ලද දායකත්වයන් මූල්‍ය වාර්තාවල වියදම් ලෙස හඳුනාගෙන ඇත.

3..2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්

වෙළඳ හා අනෙකුත් ගෙවීම ඒවායෙහි පිරිවැය මත මුල්‍ය වාර්තා වල දක්වා ඇත.

3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික

පාරිතෝෂික සඳහා මුල්‍ය වාර්ථා වල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 16 ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛන්ඩ වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමනි.

## 04 ආදායම් ප්‍රකාශය

4.1 ආදායම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව අදල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත අදායම් හදුනාගෙන ඇත.

4.2 වියදම්

ආදායම් විස්තරයේ ලාභය හෝ අලාභය හදුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හදුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිගය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යපාරය පවත්වාගෙන යෑම සඳහා දරණ ලද වියදම් අදායම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදීඇති නිළධාරීන් සහ සේවකයන්ගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරගනු ලබන අතර අදල වියදම් තීරු තුල පෙන්වා ඇත.

4.3 මුල්‍ය වියදම්

ස්ථාවර තැන්පතු වල පොලී ආදායම උපචිත ක්‍රමයට ගිණුම් ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මූල්‍යය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

4.4 දීමනා

ප්‍රදන හා අධාර ර්ට අදල වියදම් වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම් වලට අදල මූල්‍යමය නොවන ප්‍රදන එහි මුල්‍ය වටිනාකමට ගිණුම් ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

## 05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

5.1 මුදල්

මුදල් යනුවෙන් හදුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල බවට පරිවර්ථනය කළහැකි එසේ පරිවර්ථනය කිරීමේදි කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, අතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

## 06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

- ආදායම් වියදම් ප්‍රකාශය
- ශේෂ පත්‍රය
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

2011

## ආදයම් වියදම් ප්‍රකාශය

| 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ප්‍රකාශය | | |
|---|---|---|
| | **31-12-2011** | **31-12-2010** |
| | | |
| ආදායම | 69,268,569 | 61,609,826 |
| | **69,268,569** | **61,609,826** |
| | | |
| රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 74,600,000 | 69,700,000 |
| | | - |
| | **74,600,000** | **69,700,000** |
| | | |
| මුලු ආදායම | **143,868,569** | **131,309,826** |
| අඩු කිරීම් | | |
| මෙහෙයුම් වියදම් | | |
| සේවක වේතන වියදම් | (82,853,600) | (77,807,145) |
| කළමණාකාරිත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | (305,600) | (83,000) |
| පාරිතෝෂිත වෙන්කිරීම් | (4,622,033) | (3,006,358) |
| ක්ෂයවීම් | (83,935,354) | (86,299,992) |
| අනෙකුත් වියදම් | (46,192,162) | (46,716,850) |
| | **(217,908,750)** | **(213,913,346)** |
| | | |
| මෙහෙයුම් ලාභය හා අලාභය | (74,040,180) | (82,603,520) |
| අතිරික්ත පාරිතෝෂිත වෙන්කිරීම් | | - |
| මුල්‍ය වියදම් | (177,912) | (1,365,985) |
| බදු පෙර ලාභ අලාභ | **(74,218,093)** | **(83,969,505)** |
| | | |
| එකතුකළා මෙහෙයුම් නොවන ආදයම් | | |
| එකතු කළා - ස්ථාවර තැන්පතු පොලී ආදයම් | 719,628 | 646,369 |
| | **(73,498,464)** | **(83,323,136)** |
| පෙර බදු ශුද්ධ ලාභය | | |
| | | |
| ආදයම් බදු | (70,164) | (63,097) |
| බදු පසු ශුද්ධ ලාභය | **(73,568,628)** | **(83,386,233)** |
| | | |

**Approved for and on behalf of the Board of Management of Sugathadasa National Sports Complex Authority**

D. C. W. AMARASEKARA
MANAGER (ACCOUNTS)
Sugathadasa National Sports Complex Authority
**Manager - Accounts**

Brig. Priyantha Samaratunga (Rtd)
RSP, USP, ato, DPMM, MISMM.
**Chairman**
Chairman
Sugathadasa National Sports Complex Authority

**Date : 11th August 2012**

LT COL L H MAHINDA RAJAPAKSHA RSP
DIRECTOR
Sugathadasa National Sports Complex Authority
Director

## ශේෂ පත්‍රය

| 2011 දෙසැම්බර් මස 31 දිනට ශේෂපත්‍රය | | |
|---|---|---|
| | **31-12-2011** | **31-12-2010** |
| ස්ථාවර වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් | 2,856,612,140 | 2,856,612,140 |
| ගොඩනැගිලි | 1,093,331,754 | 1,112,331,050 |
| කෘත්‍රිම ධාවන පථය | - | 2,791,340 |
| අධිබලැති විදුලි කුළුනු | 4,918,748 | 6,490,944 |
| අධිබලැති විදුලි බල්බ | 641,748 | 1217160 |
| යන්ත්‍ර හා උපකරණ | 188,750,555 | 218,181,425 |
| පරිඝනක | 44,376 | 354,536 |
| මොටර් රථ | 11,163,872 | 5,178,496 |
| ක්‍රීඩා උපකරණ | 20,427,422 | 16,552,391 |
| ලී බඩු හා උපකරණ | 1,205,545 | 1,918,902 |
| කාර්යාලීය හා අනෙකුත් උපකරණ | 8,894,310 | 7,046,813 |
| තිර රෙදි | 2 | 500,482 |
| කෙරී ගෙන යන වැඩ | 105,986,118 | 0 |
| | **4,291,976,590** | **4,229,175,680** |
| | | |
| දිගුකාලීන වත්කම් | | |
| ස්ථාවර තැන්පත් | 9,559,083 | 19,520,462 |
| | **9,559,083** | **19,520,462** |
| | | |
| ජංගම වත්කම් | | |
| තොගය | 10,964,343 | 10,478,415 |
| අත්තිකාරම් හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 5,930,147 | 7,875,363 |
| කාර්ය මණ්ඩල සඳහා ලබාදුන් ණය | 17,174,410 | 12,836,541 |
| ණය ගැතියෝ | 42,959,310 | 43,736,670 |
| මුදල් හා බැංකු ශේෂය | 58,683,222 | 3,096,025 |
| | **135,711,432** | **78,023,015** |
| | | |
| මුළු වත්කම් | **4,437,247,105** | **4,326,719,158** |
| | | |
| ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම් | | |
| රජයේ ප්‍රධාන | 5,319,165,708 | 5,018,876,106 |
| සමුච්චිත අරමුදල | (868,442,965) | (798,675,248) |
| වාහන ප්‍රත්‍යාගන අතිරික්තය | 4,674,423 | 4,674,423 |
| අතිරික්ත / ඌනතාවය | (73,568,628) | (83,386,233) |
| | **4,381,828,537** | **4,141,489,048** |
| | | |
| ජංගම නොවන වගකීම් | | |
| පාරිතෝෂික දීමනා | 29,935,914 | 25,306,495 |
| | **29,935,914** | **25,306,495** |
| | | |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණයහිමියෝ | 9,548,279 | 133,034,832 |
| අනෙකුත් ණයහිමියන් | 4,187,952 | 11,263,607 |
| ආරක්ෂිත තැන්පතු | 3,439,727 | 6,674,200 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම් | 7,695,020 | 7,074,921 |
| ලැබු අත්තිකාරම් මුදල් | 541,513 | 1,812,957 |
| බදු වෙන් කිරීම් | **70,164** | **63,097** |
| | **25,482,654** | **159,923,614** |
| | | |
| මුළු ප්‍රාග්ධන ස්කන්ධය හා වගකීම් | **4,437,247,105** | **4,326,719,158** |
| | | |

## අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
|---|---|---|
| | **31-12-2011** | **31-12-2010** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| ශුද්ධ ඌණතාවය | (73,498,464) | (83,323,136) |
| | | |
| ක්‍ෂය වෙන්කිරීම් | 83,935,354 | 86,299,992 |
| සමුච්චිත අරමුදලට පසුගිය වසර වල කරන ලද ක්‍ෂය ගැලපීම් | (10,874,767) | (1,058,056) |
| වාහන විකුණුම් ලාභය | - | (685,405) |
| පාරිතෝෂික වෙන් කිරීම් | 4,974,002 | 3,006,358 |
| වසරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | **4,536,125** | **4,239,754** |
| | | |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | (485,928) | (429,126) |
| (වැඩිවීම්) / අඩුවීම් ලැබිය යුතු ශේෂය | (1,615,292) | (3,566,392) |
| (වැඩිවීම්) / අඩුවීම් ගෙවිය යුතු ශේෂය | (134,511,124) | 135,745,485 |
| මුදල් උත්පාදන මෙහෙයුම් | **(132,076,219)** | **135,989,721** |
| | | |
| පාරිතෝෂික දීමනා ගෙවීම් | (344,584) | (457,765) |
| | | |
| | **(132,420,802)** | **135,531,956** |
| ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපල, පිරියත හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම් | (126,761,497) | (266,118,169) |
| වාහන විකුණුම් | - | 685,405 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | 10,000,000 | |
| ස්ථාවර තැන්පතු නිදහස් කිරීම | (38,621) | (10,038,999) |
| | (116,800,118) | (275,471,762) |
| | | |
| මූල්‍යකරණ කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| සමුච්චිත අරමුදලෙහි වෙනස් වීම් | 13,618,515 | 358,758 |
| රජයේ ප්‍රදාන | 291,189,602 | 142,000,000 |
| | **304,808,117** | **142,358,758** |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම | 55,587,197 | 2,418,952 |
| වර්ෂ ආරම්භයේදි මුදල් හා මුදල් සාමාන්‍යය | 3,096,025 | 677,073 |
| වර්ෂ අවසානයේදී මුදල් හා මුදල් සාමාන්‍යය | **58,683,222** | **3,096,025** |

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## ➢ විගණකාධිපති වාර්තාව

2011

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } පීආර්/ඊ/එස්එන්එස්සීඒ/ එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2012 ඔක්තෝබර් [illegible] දින

සභාපති
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 ජූලි 18 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No } 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்னஞ்சல் / E-mail } oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

-----------------------------------

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

------------------------

2011 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය ශූන්‍ය වටිනාකමක් ඇති එහෙත් 2011 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රයෝජනයට ගන්නා අධිකාරිය සතු පිරිවැය රු. 27,447,432 ක් වූ යන්ත්‍ර සහ වෙනත් උපකරණ ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ඇතුළත් කිරීමට අධිකාරිය විසින් කටයුතුකර නොතිබුණි

**2.2.2** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) අධිකාරියේ ගිණුම් වලට අනුව පුද්ගලික ආයතනයන් දෙකක් වෙත පිළිවෙලින් රු.4,160 ක් සහ රු.14,757 ක් ගෙවිය යුතුව තිබුණු අතර එම ආයතන විසින් විගණන අංශය වෙත එවන ලද සනාථ කිරීම් අනුව ශේෂයන් පිළිවෙලින් රු.24,539 ක් සහ රු.345,746 ක් බව නිරීක්ෂණය විය.

(ආ) ශේෂ පත්‍රය අනුව 2011 දෙසැම්බර් 31 දිනට රු.42,959,310 ක ලැබිය යුතු ශේෂයක් පැවති අතර, ඉන් රු.37,398,318 ක් එනම් 87% ක් වසර තුනකට පෙර සිට පැවත එන ශේෂයන් විය. මෙම ශේෂයෙන් රු.34,769,162 ක් එනම් 92% ක් ණය ගැතියන් දෙදෙනෙකු ගෙන් අයවිය යුතු ව පැවතුනි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ක්‍රීඩාංගණ වෙන්කිරීම වෙනුවෙන් අධිකාරිය වෙත රු.4,465,941 ක මුදලක් ලැබිය යුතුව පැවති අතර ඉන් රු.4,309,400 ක් වසර 2 කටත් වඩා පැරණි ශේෂයන් විය.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුමෙහි රු.234,020 ක ශේෂයක් පෙන්නුම් කෙරුණු අතර ඒ තුල 2007 හා 2009 වර්ෂවලට අයත් පිළිවෙලින් රු.23,150 සහ රු.86,800 ක් වූ ශේෂයන් විය.

(ඉ) 2009 ජනවාරි 30 දින දැයට කිරුළ වෙනුවෙන් ගෙවා තිබුණු රු.86,800 ක් වූ අත්තිකාරම් සහ 2005 වර්ෂයේදී XXXI වන ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වූවන්ගේ ගමන් වියදම් ලෙස ගෙවා තිබුණු රු. 23,150 ක අත්තිකාරම් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 දෙසැම්බර් 31 දිනට රු.42, 959,310 ක් වූ ණයගැති ශේෂය තුල රු.5, 865,850 ක් වූ විවිධ ණයගැතියන් සහ තවත් ආයතන 18 කින් ලැබිය යුතු ශේෂයක් ඇතුලත් වී තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ලැබිය යුතු ණය ගැති ශේෂය රු.25,573,845 ක්ද එම ශේෂයේ ඇතුලත් වූ අතර එය මුළු ණයගැතියන්ගේ 60 % නියෝජනය කෙරේ. අධිකාරියට අයත්ව පැවති ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය දීර්ඝකාලීනව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනට බදු දී ඇති අතර එම ණය ශේෂය අයකර ගැනීමේ අවධානමක් පවතින බවද නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රීඩාංගණ වෙන්කිරීම වෙනුවෙන් ආයතනය 7 කින් අධිකාරිය වෙත රු.4,486,892 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) විෂයයන් 03 කට අදාළ එකතුව රු.17,227,876 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම්, විස්තරාත්මක උපලේඛන, සතොක්ෂණ වාර්තා ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් 2006 වසරේ සාෆ් ක්‍රීඩා උළෙල වෙනුවෙන් රු.මිලියන 44 ක් පමණක් වටිනා විද්‍යුත් කාල සතක පද්ධතියක් ඔමේගා ටයිමින් සිස්ටම් ඇන්ඩ ස්විස් ටයිමින් සිස්ටම් ආයතනයෙන් මිළදී ගෙන තිබුණි. මෙම මිළදී ගැනීමට අදාළ කිසිදු ගොනුවක් අධිකාරියට පවරා නොතිබුණි. අමාත්‍යාංශය විසින් එම පද්ධතිය අධිකාරිය වෙත විධිමත් පරිදි පවරා නොතිබුණු අතර, එය අධිකාරියේ ස්ථාවර වත්කම් වලටද ඇතුළත් කර නොතිබුණි. මෙම පද්ධතිය අක්‍රියවීම හේතුවෙන් දැනට එය භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඇ) පෙර වර්ෂ ගැලපීම් වලට අදාලව සංලක්ෂය නිවැරදිව / පැහැදිළිව සටහන් නොකිරීම හා අදාල ජ'නල් වවුචර් පවත්වා ගෙන නොයාම හේතුවෙන් ඒවායේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ රඳවා ගැනීමේ තැන්පතු වල වටිනාකම රු.3, 439,727 කි. එම තැන්පතු වාර්ෂිකව අළුත් ලෙජරයක සටහන් කළ යුතු අතර, එහි පෙර වර්ෂ සාරාංශ වාර්තාවක් ලෙජරයේ ඇතුළත් කළ යුතු නමුත් එසේ සිදුකර නොතිබුණි

### 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීතිරීති යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක: පීඊඩී/12 දරන චක්‍රලේකය - 6.5.1 වගන්තිය | කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 30 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේදී ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනයට අයත් රු.781,784,954 ක් වූ ස්ථාවර වත්කම් හා රු.2,149,491 ක්වූ ඉන්වෙන්ට්‍රි අයිතම සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/ 2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග වෙනුවෙන් වෙනම ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඊ4/40/5/252/1 හා 2011 ජුලි 25 දිනැති ලිපිය | අනුමත බඳවා ගැනීම් පටිපාටියට අනුව කණිෂ්ඨ ආරක්ෂක නියාමක තනතුරු 26 ක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමත කර තිබිය දී බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර ගැනීමට පෙර එනම් 2011 නොවැම්බර් 15 දින ආරක්ෂක නියාමකයින් 25 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 76,090,410 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 82,603,520 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,513,110 ක වර්ධනයක් පෙන්නුම්කෙරුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද අධිකාරියේ ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය කිරීමේදී පසු ගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අයභාර වියදම් දැරීම සඳහා රජය ප්‍රදාන වශයෙන් ලබා දුන් මුදල රු.4,900,000 ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර එය 7% කින් වැඩි වීමකි. එසේම අධිකාරිය මෙහෙයුම් ආදායම රු.7,397,134 කින් වැඩි වී තිබුණු අතර මෙහෙයුම් වියදම රු.5,784,024 කින් වැඩි වී තිබුණි. එම ආදායම් වැඩි වීමේ ප්‍රතිශතය 12% ක් වන අතර වියදම වැඩි වීමේ ප්‍රතිශතය 2% ක් පමණක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------

### 4.1 කාර්ය සාධනය

--------------

අධිකාරිය විසින් ක්‍රීඩාංගනවල ආදායම වැඩි කර ගැනීමටත්, විශේෂයෙන් එළිමහන් හා ගෘහස්ථ ක්‍රීඩාංගනයන්හි ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය හා එවැනි ක්‍රියාමාර්ග තුළින් නව ආදායම් අවස්ථා ඇති කර ගැනීමටත් නිසියාකාර වියදම් කළමණාකරණයක් සිදු කිරීමටත් ප්‍රමාණවත් පරිදි කටයුතුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයතුල සහ පසුගිය වර්ෂ 2 ක කාලය තුල අධිකාරියේ එක් එක් ක්‍රීඩාංගනයෙන් උපයා ඇති ආදායම් සහ වියදම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

- ගෘහස්ථ ක්‍රීඩාංගනයේ සෑම වර්ෂයකම ආදායම වැඩිවීමේ සීඝ්‍රතාවයට වඩා වැඩි වේගයකින් වියදම වැඩි වී තිබුණි.
- බෝගම්බර ක්‍රීඩාංගනයේද ආදායම් මට්ටම 2009 වර්ෂයට සාපේක්ෂව අඩුවීමේ ප්‍රවනතාවයක් දැකිය හැකිවන අතර වියදම ඉතා වැඩිවේගයකින් වැඩිවී තිබුණි.
- බෙලිඅත්ත ක්‍රීඩාංගනයේ ආදායම සෑම වර්ෂයකදීම ආදායම ඉක්මවූ වියදම 70 % සිට 100% ක වැඩිවීමක් දක්නට ලැබුණි.

### 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2011 වර්ෂයේ ලියා තිබූ රු.524,729 ක් වටිනා චෙක් පත් 7 ක් සැපයුම්කරුවන් වෙත භාර දීම මාස 1 සිට 3 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණයවිය

(ආ) අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියට අයත් වාහන 06 ක්, ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් හා අයිතිය පිළිබඳ විස්තර නොමැති අත් ට්‍රැක්ටර් 02 ක් දැනට පරිහරණය කරන අතර එම වාහන මෙතෙක් නිත්‍යාණුකූලව අධිකාරියට පවරාගෙන නොතිබුණි.

(ඇ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම ලෙස පෙන්වන රු.135,000,000 වූ බෝගම්බර ක්‍රීඩාංගණයේ අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය සතු බැව් විගණයේදී නිරීක්ෂණය වූ අතර ක්‍රීඩාංගනයේ අයිතිය අධිකාරියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලය බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) අධිකාරියට අයත් ක්‍රීඩා හෝටලය මසකට රු. 760,000 බැගින් අවුරුදු 03 ක කාලයක් සඳහා පෞද්ගලික ආයතනයකට බදු දීමට 2010 ඔක්තෝබර් 18 දින පැවති ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ දී තීරණයක් ගෙන 2010 නොවැම්බර් 15 දින බදු ගිවිසුමකට එළඹ තිබුණි. බදුකරු විසින් කර තිබුණු අයථා කටයුත්තක් හේතුවෙන් බදු ගිවිසුම අත්හිටුවන ලෙසට ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සභාපතිවරයා වෙත කරන ලද දැනුම් දීම හේතුවෙන් 2010 දෙසැම්බර් 16 දින බදු ගිවිසුම අත්හිටුවන බව ටෙන්ඩර්කරු වෙත දන්වා තිබුණි.

(ආ) ලේකම්වරයා විසින් පසුව කරන ලද දැනුම් දීමකට අනුව 2011 මාර්තු 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගිවිසුම අවලංගු කර අධිකාරිය විසින් හෝටලය පවත්වා ගෙන යාමට තීරණයක් ගෙන අධිකාරිය විසින් හෝටලය පවත්වාගෙන ගොස් තිබුණි. 2011 වර්ෂය තුළදී හෝටලයෙන් රු. 6,961,761 ක සමස්ථ ආදායමක් උපයාගෙන තිබුණ ද ගිවිසුම ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අධිකාරියට රු2,158,239 ආදායමක් අහිමිවී තිබුණි. කෙසේ වුවද නැවත හෝටලය බදු දීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2009 වර්ෂයේ දී රු. 4,912,403 ක් වැය කර රථගාලෙහි සවි කිරීම සඳහා විද්‍යුත් බාධක යන්ත්‍රයක් පුද්ගලික සමාගමකින් මිළදී ගෙන තිබුණි. එහිදී පහත අඩුපාඩු නිරීක්ෂනය විය.

(i) මිළදී ගන්නා අවස්ථාවේදී මෙම උපකරණයේ පහත සඳහන් පහසුකම් ඇති බව තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවෙහි සඳහන්ව තිබුණද, එම පහසුකම් නොතිබුණු බැව් අභ්‍යන්තර විගණන නිරීක්ෂණ තුලින් අනාවරණය වී තිබුණි.

- අංක තහඩු හඳුනා ගැනීමේ පද්ධතිය
- යතුරු පැදි සහ අනෙකුත් වාහන ස්වයංක්‍රීයව හඳුනා ගැනීමට එහි ඇති සංවේදීතාවය

- ඕනෑම පංතියක හෝ ඕනෑම වර්ගයක වාහනයක් ස්වයංක්‍රීයව හඳුනා ගැනීමට එහි ඇති සංවේදීතාවය

- වාහනයක් නික්ම ගිය පසු මාර්ග බාධක ගේට්ටු හෝ වෙනත් ගේට්ටු ස්වයංක්‍රීයව වැසීයාමට මෙම වාහන නිරීක්ෂණ උපකරණ භාවිතා කිරීම.

(ii) අධිකාරියේ තොරතුරු තාක්ෂණ නිලධාරිගේ 2012 ජනවාරි 13 දිනැති ලිපියකට අනුව එම උපකරණය අළුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණි. මුල් සමාගමේ පරිවර්තිත සමාගමක් වන මෙම ආයතනය අදාළ මුල් පද්ධතිය වෙනුවට ආදේශක පද්ධතියක් ආයතනයට සපයා තිබුණද දැනට අධිකාරිය විසින් එම පද්ධතිය ක්‍රියාවේ යොදවා තිබේ. මුල් පද්ධතිය සිංගප්පූරුව වෙත යවා ඇති නමුත් එය අළුත්වැඩියා කළ නොහැකිබව දන්වා ඇති බව සභාපතිවරයා විසින් මාවෙත වාර්තාකර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට රු.430,936 ක් වටිනා භාණ්ඩ වර්ග 42 ක් චලනය නොවන භාණ්ඩ වශයෙන් ගබඩාවේ පැවතුණි. මෙම භාණ්ඩ අපහරණය කිරීම සඳහා අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දීමේ බදු ගිවිසුමෙහි පහත දැක්වෙන ඌනතාවයන් නිරීක්ෂණය විය.

| | බදු ගිවිසුමේ කොන්දේසි | ඌණතාවය |
|---|---|---|
| (අ) | ගිවිසුමේ 4 (කියු) වගන්තිය අනුව ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනයේ සේවය කරමින් සිටි ක්‍රීඩාංගන සේවකයන් අවම වශයෙන් 20 දෙනෙකු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් බඳවා ගැනීමට නියමිතව තිබුණි. | සේවකයන් කිසිවෙකු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් බඳවා ගෙන නොතිබීම හේතුවෙන් ගිවිසුමේ අවශ්‍යතාවයන් උල්ලංඝනය වී තිබූ අතර ක්‍රීඩාංගණයට අනුයුක්තව සිටි ඒ පිළිබඳ විශේෂ දැනුමක් ඇති සේවකයන් 17 දෙනෙකු සඳහා රු. 4,004,430 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී දැරීමට අධිකාරියට සිදුවී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ගිවිසුමේ 4(එස්) වගන්තිය අනුව, ක්‍රීඩාංගනයේ සියළු ගොඩනැගිලි සහ ඉඩකඩම් සඳහා බදු දීමනාකරුගේද උපදෙස් ලබා ගනිමින් බදු ගැණුම්කරු විසින් පූර්ණ රක්ෂණාවරණයක් ලබා ගත යුතුව තිබුණි. | සමාලෝචිත වර්ෂය දක්වාම එවැනි රක්ෂණ ආවරණයක් ලබා නොතිබුණි. |
| (ඇ) | වර්ෂ 30 ක් වැනි දීර්ඝ කාලයක් සඳහා බදුකුලී වටිනාකම කාර්තුවකට රු.750,000 වශයෙන් ස්ථාවරව පවත්වා ගෙන යාමට තීරණය කර තිබීම. | මුදලේ අගය අඩු වීම මත ඇතිවන අනාගත අවාසිදායක තත්ත්වය මඟහරවා ගැනීම සඳහා බදුකුලී වටිනාකමට කළ යුතු සංශෝධනයක් සිදුකර නොතිබුණි. |
| (ඉ) | ගිවිසුමේ 5(අයි) වගන්තිය අනුව ක්‍රීඩාංගනය සතු සියළුම වත්කම් භෞතිකව සත්‍යාපනය කර තොග ලේඛනයක් සකස් කර බදු ගැණුම්කරුට පිටපතක් ලබා දීම. | වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. |

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2001 පෙබරවාරි 28 දිනට ඉදිරිපත් කළ යුතු වුවත් 2011 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනය සතු සම්පත්, සංවිධාන සැලැස්ම, පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල, කළමණාකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් සහ කාර්යය සාධනය පිළිබඳ තොරතුරු ඇතුලත් කර සංයුක්ත සැලැස්ම සකස් කළ යුතු වුවත් 2011 වර්ෂය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.3 කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් පැවැත්වීම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස තුනකටම වරක් රැස්විය යුතු වුවද 2011 වර්ෂයේ පවත්වා තිබුණේ රැස්වීම් වාර දෙකක් පමණි.

**6. පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපති වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය.
(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු කිරීම
(ඇ) ගබඩා පාලනය
(ආ) නීති රීති රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වීම.
(ඇ) ණයගැතියන්ගෙන් මුදල් අය කර ගැනීම.
(ඇ) ආදායම් කළමණාකරණය
(ඉ) ජර්නල් සටහන් පවත්වාගෙනයාම.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති